# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

### කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ වන කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් 2019.02.22 දින ප්‍රකාශයට පත් කළ අංක 2,112 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I වන පන්තියේ පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවන ලද 02-847 ගැසට් නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය යන්න නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

2. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I වන පන්තියේ පුරප්පාඩු සංඛ්‍යාව 49 ක් ලෙස සංශෝධනය කරනු ලැබේ.

3. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ 1986.01.01 දින සිට ක්‍රියාත්මක වන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පවත්නා ප්‍රතිපාදනයන්ට අනුව එම සේවයේ I පන්තියේ පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

4. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I වන ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන්නේ 2019.02.22 දින ප්‍රකාශයට පත්කළ *ගැසට්* පත්‍රයෙහි සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට එනම් 2019.03.15 දිනට අදාළව අයදුම්පත් ඉදිරිපත් කරන ලද නිලධාරීන් වේ.

5. ඉහත අංක 04 අනුව, ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I වන ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනය (2019.03.15) සහ 2019.03.15 දිනට සේවයේ යෙදී සිටි නමුත් මේ වන විට විශ්‍රාමික නිලධාරීන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට කටයුතු කරනු ලැබේ.

6. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I වන පන්තියට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමේ පටිපාටිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ පටිපාටිය

1. සේවා පළපුරුද්ද - ලකුණු 40

1.1 පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ සමාන සුදුසුකම් හෝ සහිතව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියේ වසර 01 ක සතුටුදායක සේවා කාලයෙන් පසුව එළඹෙන,

(i) එක් වසරක සතුටුදායක සේවා කාලයක් සඳහා - ලකුණු 04
(ii) මාස 06 ක සතුටුදායක සේවා කාලයක් සඳහා - ලකුණු 02
(iii) මාස 03 ක සතුටුදායක සේවා කාලයක් සඳහා - ලකුණු 01

මාස 03 කට අඩු සේවා කාලය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

උපරිම ලකුණු 40

හෝ

1.2 ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයෙන් පසුව එළඹෙන,

(i) එක් වසරක සතුටුදායක සේවා කාලයක් සඳහා - ලකුණු 04
(ii) මාස 06 ක සතුටුදායක සේවා කාලයක් සඳහා - ලකුණු 02
(iii) මාස 03 ක සතුටුදායක සේවා කාලයක් සඳහා - ලකුණු 01

මාස 03 කට අඩු සේවා කාලය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

උපරිම ලකුණු 40

(සේවා කාලය අයදුම්පත් භාරගන්නා අවසාන දින දක්වා සලකා බලනු ලැබේ.)

2. කුසලතාවය - ලකුණු 60

2.1 ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම් සඳහා,

2.1.1. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 12.1 වගන්තිය යටතේ I පන්තියට පත්කිරීම සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් සම්පූර්ණ කළ යුතු මූලික සුදුසුකම් වන පශ්චාත් උපාධිය/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ ඊට සමාන සුදුසුකමට අමතරව සම්පූර්ණ කර ඇති උපාධි සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | |
|---|---|
| ආචාර්ය උපාධි (PhD) | - 20 |
| පශ්චාත් උපාධි (M.Sc, MBA, MEng, MPhil, MA …) | - 15 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා (වසර 01 ට නොඅඩු) | - 10 |
| මාස 06 ට වැඩි රජයේ පිළිගත් ආයතනයකින් සිදු කළ ඩිප්ලෝමා පාඨමාලා සඳහා (එක් ඩිප්ලෝමා සහතිකයකට ලකුණු 1ක් බැගින් උපරිම ලකුණු 5) | -05 |

(කාර්යක්ෂමතා කඩඉම් සඳහා අදාළ කරගත් පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ වෙනත් පාඨමාලාවන් සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.)

2.1.2 ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 12.2 වගන්තිය යටතේ I පන්තියට පත්කිරීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා,

ආචාර්ය උපාධි (PhD) - 20
පශ්චාත් උපාධි (M.Sc, MBA, MEng, MPhil, MA .... ) - 15
පශ්චාත් උපාධි ඩිප්ලෝමා (වසර 01 ට නොඅඩු) - 10
මාස 06 ට වැඩි රජයේ පිළිගත් ආයතනයකින් සිදු කළ ඩිප්ලෝමා පාඨමාලා සඳහා - 05
(එක් ඩිප්ලෝමා සහතිකයකට ලකුණු 1ක් බැගින් උපරිම ලකුණු 5)

(කාර්යක්ෂමතා කඩඉම් සඳහා අදාළ කරගත් පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ වෙනත් පාඨමාලාවන් සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.)

2.2 II පන්තියේ උපලේඛනගත තනතුරක (ස්ථිර) සේවය කිරීමෙන් ලබා ඇති පරිපාලන පළපුරුද්ද සඳහා වසරකට ලකුණු 03 බැගින් උපරිම වසර 5 ක් සඳහා

උපරිම ලකුණු 15

2.3 ක්ෂේත්‍රයට අදාළව ප්‍රකාශයට පත් කර ඇති ස්වාධීන හෝ කණ්ඩායම් පර්යේෂණ (පර්යේෂණ, පර්යේෂණ පත්‍රිකා, පර්යේෂණ ග්‍රන්ථ, නිබන්ධන, වෙනත් ග්‍රන්ථ, සහ එළි දක්වා ඇති නව නිපයුම් සඳහා) මෙහිදී එකකට ලකුණු 05 බැගින් පර්යේෂණ 3ක් සඳහා

උපරිම ලකුණු 15

(අදාළ සුදුසුකම තහවුරු කිරීම සඳහා අදාළ පරිදි ග්‍රන්ථ, නිබන්ධන, පත්‍රිකා සහ/හෝ පේටන්ට් බලපත්‍ර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ ඉදිරිපත් කළ යුතු අතර එම නිර්මාණ පිළිගත් අධිකාරියක් මඟින් ප්‍රකාශයට පත් කර/එළි දක්වා ඇති බව එහිදී තහවුරු කළ යුතුය. කිසිදු උපාධි පාඨමාලාවක් වෙනුවෙන් ඉදිරිපත් කරන ලද නිබන්ධන මෙහිදී සළකා බලනු නොලැබේ.)

සටහනः කණ්ඩායම් පර්යේෂණ සඳහා ලකුණු ලබා දීමේදී එම පර්යේෂණයට සහභාගී වූ සාමාජිකයන් අතර සමාන ලකුණු ලැබෙන සේ එක් පර්යේෂණයක් සඳහා ලබා දෙන ලකුණු 05, සාමාජිකයින් ගණනින් බෙදා සමාන ලකුණු ලබා දෙනු ලැබේ.

2.4 අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්කරුගේ සේවා ක්ෂේත්‍රයට අදාළව පොදු 230 බී ආකෘතිය අනුව නිකුත් කරන ලද ප්‍රශංසා සහතික 1කට ලකුණු 01 බැගින්

උපරිම ලකුණු 05

(එකම කරුණකට අදාළව නිලධාරීන් කිහිප දෙනෙකු වෙත ප්‍රශංසා සහතික නිකුත් කිරීමේදී එම නිලධාරීන් සම්බන්ධව සමාන සැලකීමක් සිදු කර සලකා බලා ඇත්ද යන්න පිළිබඳව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අවධානයට ලක් කළ යුතුය. යම්කිසි ප්‍රශංසා සහතිකයක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඊට හේතු අයදුම්කරු වෙත පැහැදිලි කළ යුතු අතර ඒ පිළිබඳ සංක්ෂිප්ත සටහනක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල උපලේඛනයේ සඳහන් කළ යුතුය.)

2.5 ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය
රජය මගින් අනුමත ආයතනයක් විසින් නිකුත් කරන ලද
ඩිප්ලෝමා පාඨමාලාව - ලකුණු 2.5
සහතික පත්‍ර පාඨමාලාව - ලකුණු 1.25

2.6 පරිගණක සාක්ෂරතාවය
රජය මගින් අනුමත ආයතනයක් විසින් නිකුත් කරන ලද
ඩිප්ලෝමා පාඨමාලාව - ලකුණු 2.5
සහතික පත්‍ර පාඨමාලාව - ලකුණු 1.25

(සියළු ඩිප්ලෝමා පාඨමාලාවන් පැය 720 කට හෝ මාස 6 කට නොඅඩු විය යුතු අතර සහතික පත්‍ර පාඨමාලාවන් පැය 360 කට හෝ මාස 03 කට නොඅඩු විය යුතුය.)

* ඉහත සංශෝධිත කරුණු හැර ඉතිරි සියල්ල 2019.02.22 දින ප්‍රකාශයට පත් කළ *ගැසට්* පත්‍රයේ පරිදිම නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ඩී.එම්.සරත් අබයගුණවර්ධන,
ලේකම්,
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

අංක 354/2, "නිපුණතා පියස",
ඇල්විටිගල මාවත,
කොළඹ - 05.

07-299

